විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2015/2016 අධ්‍යයන වර්ෂය
**www.ugc.ac.lk**

**විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳව දැන ගත යුතු අත්‍යාවශ්‍ය කරුණු**

1. කලා විෂය ධාරාවේ අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම ප්‍රධාන වශයෙන්ම දිප ව්‍යාප්ත කුසලතා පදනම මත සිදු කෙර්.

2. අනෙකුත් විෂය ධාරාවල අධ්‍යයන පාඨමාලා සඳහා (භෞතිය විද්‍යා, ජෛවීය විද්‍යා, වාණිජ, ඉංජිනේරු තාක්ෂණවේදය සහ ජෛවපද්ධති තාක්ෂණවේදය) සිසුන් තෝරා ගැනීම 40% ක් දිප ව්‍යාප්ත කුසලතා පදනම මතද 55% ක් දිස්ත්‍රික් කුසලතා පදනම මතද 5% ක අමතර ස්ථාන සංඛ්‍යාවක් අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යැයි සැලකෙන දිස්ත්‍රික්ක 16 අතරේද බෙදී යන පරිද්දෙන්ද සිදුකෙරේ.

3. යම් කිසි විෂය ධාරාවක පාඨමාලාවක් සඳහා ඔබ තේරී පත්වූ පසුව (භෞතිය විද්‍යා, ජෛවීය විද්‍යා, කලා, වාණිජ, ඉංජිනේරු තාක්ෂණවේදය හෝ ජෛවපද්ධති තාක්ෂණවේදය) අදාළ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා සිසුන් අනුයුක්ත කිරීම සිසුන් දැක්වූ කුසලතාවය මත පමණක් සිදු කෙරේ.

4. ඔබ විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ඔබ වඩාත්ම කැමැත්තක් දැක්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාලයම ඔබට ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සෑම විටම උත්සහ කරයි.

5. ඉහත අරමුණ ඉටු කර ගැනීමේදී සියල්ලන්ටම සාධාරණයක් ඉටු වන පරිද්දෙන් එය සිදු කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වගකීමයි.

6. සාමාන්‍යයෙන් කිසියම් පාඨමාලාවක් සඳහා සුදුසුකම් ලැබීම තීරණය වන්නේ ඔබ අ.පො.ස.(උසස් පෙළ) විභාගයට පෙනී සිටි විෂය ධාරාව අනුවයි. එබැවින්, බොහෝ සිසුන් අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි විෂය ධාරාව අනුව තමන් සුදුසුකම් ලබන පාඨමාලා ලැයිස්තුවක් සකසා ගනී.

7. නමුත්, උසස් පෙළ විෂය ධාරාව මතම තීරණය නොවන පාඨමාලාද පවතී. උදාහරණ වශයෙන් ව්‍යාපෘති කළමනාකරණය, පරිවර්තන අධ්‍යයන, සිනමා හා රූපවාහිනී අධ්‍යයන දැක්විය හැකිය. එබඳු සියලු පාඨමාලා පිළිබඳ විස්තර ඉදිරියේදී නිකුත් කරනු ලබන ප්‍රවේශ අත්පොතේ පිටු අංක 81 සිට 104 දක්වා ලබා දී ඇත.

8. එමෙන්ම, තවත් වැදගත් කාරණයක් වන්නේ ඇතැම් පාඨමාලා විෂය ධාරා කිහිපයක සිසුන් සඳහා විවෘතව පැවතීමයි. නමුත් එම පාඨමාලා සඳහා විශේෂිත විෂය සංයෝජන පවතී. උදාහරණ වශයෙන් නීතිය සහ තොරතුරු තාක්ෂණය දැක්විය හැකිය. එබඳු සියලු පාඨමාලා පිළිබඳ විස්තර ප්‍රවේශ අත්පොතේ පිටු අංක 81 සිට 104 දක්වා ලබා දී ඇත.

9. ඇතැම් අධ්‍යයන පාඨමාලා සඳහා සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේදී විශේෂිත පූර්වඅවශ්‍යතා සපුරා තිබීම අත්‍යාවශ්‍ය වේ. උදාහරණයක් වශයෙන් නීතිය පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීමට නම් අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. සාමාන්‍ය පෙළ පූර්ව අවශ්‍යතා පිළිබඳ විස්තර ප්‍රවේශ අත්පොතේ 135 පිටුවේ දක්වා ඇත.

10. එසේම, ඇතැම් පාඨමාලා සඳහා යෝග්‍යතා පරීක්ෂණ වලින් සමත්වීම අත්‍යාවශ්‍යවේ. එම යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන්නේ අදාළ විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන මගිනි. ඔබ යෝග්‍යතා පරීක්ෂණ සහිත පාඨමාලාවකට අයදුම්කිරීමට බලාපොරොත්තු වන්නේ නම් අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී

හෝ අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී අමතා යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන දිනයන් පිළිබඳව තොරතුරු ලබා ගන්න. අදාළ විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන මගින් යෝග්‍යතා පරීක්ෂණ සඳහා පුවත්පත් දැන්වීම් පළකරනු ලැබේ. එබැවින් එම දැන්වීම් පිළිබඳව අවධානයෙන් සිට එම යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්කරන ලෙස සිසුන්ට උපදෙස් දෙනු ලැබේ. යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන පාඨමාලා පිළිබඳ විස්තර ප්‍රවේශ අත්පොතේ 136 පිටුවේ දක්වා ඇත. යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල දුරකථන අංක ප්‍රවේශ අත්පොතේ 247 පිටුවේ දක්වා ඇත.

11. පහත සඳහන් කරුණු ඔබ සුදුසුකම් ලබන පාඨමාලා හඳුනාගැනීමට සහ පාඨමාලා ලැයිස්තුවක් සකසා ගැනීමට ඔබට උපකාරීවනු ඇත.

12. ඔබගේ කැමැත්තේ අනුපිළිවෙල හඳුනාගැනීමේදී ඔබ කැමති පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය යන දෙකම එකවර සළකා බැලිය යුතුය.

13. ඔබ කිසියම් පාඨමාලාවක් සහ විශ්වවිද්‍යාලයක් සඳහා අදාළ අවම සුදුසුකම් සහ අවශ්‍ය Z අගය සපුරා ඇත්නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඔබ වඩාත්ම කැමැත්තක් දක්වන එම පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ඔබව තෝරා ගනු ඇත.

14. ඔබ විසින් කැමැත්ත ප්‍රකාශ කර නොමැති පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා කිසිවිටෙකත් ඔබව තෝරා ගනු නොලැබේ.

15. සෑම විශ්වවිද්‍යාලයක් මගින්ම පවත්වනු ලබන එක් එක් අධ්‍යයන පාඨමාලාව සඳහා “Uni-Code” නම්වූ විශේෂිත කේතයක් ලබා දී ඇත.

16. “Uni-Code” යනු එක් එක් විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන එක් එක් අධ්‍යයන පාඨමාලාව සඳහා අනන්‍ය වූ කේතයකි. “Uni-Code” පිළිබඳ විස්තර ප්‍රවේශ අත්පොතේ 130-134 පිටුවල දක්වා ඇත.

17. “Uni-Code” හි සෑම අකුරක්ම ඉතා වැදගත්ය. එබැවින් අයදුම්පත පුරවන අවස්ථාවේදී “Uni-Code” හි සෑම අකුරක්ම ඉතාමත්ම නිවැරදිව සටහන් කරන්න.

**විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත්‍රය පිරවීමට පෙර අනුගමනය කළ යුතු පියවර**

1. 2015/2016 අධ්‍යයන වර්ෂයට අදාළ ප්‍රවේශ අත්පොත සම්පූර්ණයෙන්ම කියවන්න.

2. ඔබ සුදුසුකම් ලබන අධ්‍යයන පාඨමාලා, විශ්වවිද්‍යාල සහ ඒවායේ “Uni-Code” ලැයිස්තුවක් සකසා ගන්න. “Uni-Code” භාවිත කර අයදුම්පත්‍රය පුරවන ආකාරය පිළිබඳ උදාහරණ ප්‍රවේශ අත්පොතෙහි 105-106 පිටුවල දක්වා ඇත.

3. පසුව, ඔබ සුදුසුකම් ලබන ඉහත පාඨමාලා සහ විශ්වවිද්‍යාල ඔබගේ කැමැත්තේ අනුපිළිවෙල අනුව සකසා ගන්න.

4. ඒ අතරින් ඔබ අයදුම්කිරීමට බලාපොරොත්තු වන පාඨමාලා සහ විශ්වවිද්‍යාල තෝරා ගන්න.

5. ප්‍රවේශ අත්පොතෙහි පිටු අංක 212 සිට 215 දක්වා ලබා දී ඇති පෙර වසරේ කඩයිම් ලකුණු මත තීරණ ගැනීමෙන් වළකින්න. එයට හේතුව කඩයිම් ලකුණු වසරින් වසර වෙනස් වන බැවිනි.

6. ඔබ අයදුම්කිරීමට බලාපොරොත්තු වන පාඨමාලා සහ විශ්වවිද්‍යාල අනුපිළිවෙළ “Uni-Code” භාවිතයෙන් නැවත ලියා ගන්න. එහිදී සෑම අකුරක්ම ඉතා නිවැරදිව සටහන් කිරීමට වග බලා ගන්න.

7. අයදුම්පත පිරවීම ආරම්භ කිරීමට පෙර අත්පොතේ අග ලබා දී ඇති අතින් පුරවන අයදුම්පත්‍රය පුරවා උපකාරකයක් වශයෙන් තබා ගන්න.

දැන් අයදුම්පත යොමු කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රම දෙකින් එක් ක්‍රමයක් තෝරා ගන්න.

1. අන්තර්ජාලය හරහා අයදුම්පත්‍රය යොමු කිරීම.
2. අතින් පුරවා අයදුම්පත්‍රය යොමු කිරීම.

ඉහත ක්‍රම දෙක අතුරින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තරයේ අනුමත කරන්නේ **අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීමයි.** මෙය ඉතා සරල, වේගවත්, ආරක්ෂිත සහ ඉතාමත් නිවැරදි ක්‍රමවේදයකි. එසේම අයදුම්පත්‍රය යොමු කල වහාම අයදුම්පතය ලැබුණු බව ඔබ විසින් අයදුම්පත පිරවීමේදී ලබා දුන් ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් මගින් සහ ලබා දුන් ඊමේල් ලිපිනයට ඊමේල් පණිවිඩයක් මගින් දන්වා එවනු ඇත.

**අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීම පිළිබඳව වැදගත්වන කරුණු**

1. ඔබ අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටින අවස්ථාවේදී වලංගු ජාතික හැඳුනුම්පතක් භාවිතා කර තිබිය යුතුය. එසේ නොමැතිව ඔබ විසින් වෙනත් ක්‍රමයක් භාවිත කරමින් අ.පො.ස.(උසස් පෙළ) විභාගයේදී ඔබගේ අනන්‍යතාවය තහවුරු කලේ නම් අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීමට ඔබට ඉඩ දෙනු නොලැබේ. එබැවින් ඔබට අතින් පුරවන ලද අයදුම්පත්‍රය එවීමට සිදුවේ.

2. අන්තර්ජාල සේවාව සඳහා ප්‍රවේශ වීමට පෙර ඔබගේ හැඳුනුම්පත සූදානම් කර තබා ගන්න.

3. ඔබට නිවසේ අන්තර්ජාල පහසුකම ඇත්නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට (www.ugc.ac.lk) නිවසේ සිට ප්‍රවේශ විය හැකිය.

4. ඔබට අන්තර්ජාල පහසුකම හෝ අන්තර්ජාල පරිහරණය පිළබඳ නිසි දැනුමක් නොමැති නම් ඔබගේ නිවසට ආසන්නයේ පිහිටි නැණසල මධ්‍යස්ථානයක්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයක් (ICT Centers) හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් (NAC Centers) වෙත යන්න. ප්‍රවේශ අත්පොතෙහි 248 සිට 260 දක්වා පිටුවල ඉහත මධ්‍යස්ථානයන්හි ලිපිනයන් හා දුරකථන අංක ලබාදී ඇත. ඔබගේ පාසලෙහි අදාළ පහසුකම් ඇත්නම් ඔබට එම සේවාව පාසලෙන්ද ලබා ගත හැකිය.

5. ඔබගේ නිවසට ආසන්නම මධ්‍යස්ථානය වෙත යාමේදී පහත සඳහන් ලියකියවිලි 07 රැගෙන යන්න.

    1. ඔබට උපකාරකයක් වශයෙන් සම්පූර්ණ කරන ලද **අතින් පිරවූ අයදුම්පත්‍රය**
    2. **ජාතික හැඳුනුම්පත (දෙපැත්තම ස්කෑන් කරන ලද පිටපතක් සූදානම් කර ගන්න.)**
    3. **ජංගම දුරකථන අංකයක්**
       ඔබ විසින් ලබා දෙන මෙම ජංගම දුරකථන අංකය වෙනත් කිසිවෙකු විසින් මෙම අධ්‍යයන වර්ෂයේ අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය අයදුම් කිරීමට භාවිතා නොකරන අංකයක් විය යුතුය. මෙම අංකය වැදගත් වන්නේ ඔබගේ අන්තර්ජාල ගිණුම සක්‍රිය කිරීමේ කේතය (Activation Code) යොමු කරන්නේ ඔබ විසින් සපයන මෙම ජංගම දුරකථන අංකයට වීමයි. මීට අමතරව ඉදිරියේදී සිදුවන සියලුම දැනුවත් කිරීම් මෙම දුරකථන අංකයට යොමු කෙරේ.
    4. **වලංගු ඊමේල් ලිපිනයක්**
       සක්‍රිය කිරීමේ දිගුව (Verification link) මෙම ලිපිනයට යොමු කෙරේ.
    5. **සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සහතික වල පිටපත්**
    6. **විදුහල්පති විසින් සහතික කරන ලද පාසල් හැරයාමේ සහතිකය (මෙය අදාළ වන්නේ පෞද්ගලික අයදුම්කරුවන්ට පමණි)**

**සටහන:** 01.08.2012 සිට 31.07.2015 දක්වා කාලය තුල ඔබ පාසලකට ඇතුළත් වී සිටි කාල සීමාව වසරකට වඩා අඩුනම් හෝ එම කාලසීමාව තුළ කිසිදු පාසලකට ඔබ ඇතුළත්ව නොසිටියේ නම් පහත සඳහන් ලියකියවිලි ඔබගේ අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

1. ග්‍රාම නිලධාරී සහතිකය
2. 2012/2013/2014/2015 යන වර්ෂවලට අදාළව මැතිවරණ නාමලේඛණයේ උධෘත වල මුල් පිටපත්

7. මීට අමතරව ඔබගේ නමෙහි වෙනසක් ඇත්නම් එය සහතික කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය.

6. නැණසල මධ්‍යස්ථාන, තොරතුරු හා සන්නවේදන තාක්ෂණ මධ්‍යස්ථාන සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන විසින් ඔබට සපයන සේවාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාල ආයතන සඳහා සුදුසු ගෙවීමක් සිදුකරනු ලැබේ. **එබැවින් ඒ සඳහා ඔවුනට කිසිදු මුදලක් ඔබ විසින් ගෙවිය යුතු නැත.**

7. ඔබ විසින් තනිවම හෝ ඉහත මධ්‍යස්ථානයක නිලධාරියෙකුගේ උපකාරය ඇතුව අන්තර්ජාලය හරහා අයදුම්පත්‍රය පිරවීම ආරම්භ කිරීමට පෙර ප්‍රවේශ අත්පොතෙහි තුන්වන (03) කොටස (පිටු අංක 115 සිට 139 දක්වා) හොඳින් කියවන්න.

8. වෙබ් අයදුම්පතෙහි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් අයදුම්පත්‍රය පිරවීමට අවශ්‍ය උපදෙස් පැහැදිළිව දක්වා ඇත.

9. නමුත්, ඔබ විසින් අයදුම්පත පිරවිය යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

**අන්තර්ජාල අයදුම්පත පිරවීමේදී අනුගමනය කල යුතු පියවර**

1. විශ්විවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.ugc.ac.lk වෙත ප්‍රවේශ වන්න.

2. පරිශීලකයෙකු ලෙස **ලියාපදිංචි වන්න.** මේ සඳහා අවශ්‍ය උපදෙස් වෙබ් අයදුම්පතෙහි දක්වා ඇත. ලියාපදිංචි වීමේ පියවරයන් අවසන් කල වහාම ගිණුම සක්‍රිය කිරීමේ කේතයක් (Activation Code) ඔබගේ ජංගම දුරකථනයට හා ගිණුම සක්‍රිය කිරීමේ දිගුවක් (Verification link) ඊමේල් ලිපියනයට ලැබෙනු ඇත.

3. ඔබට ලැබුණු ගිණුම සක්‍රිය කිරීමේ කේතය, ගිණුම සක්‍රිය කිරීමේ දිගුව හා ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කරමින් අන්තර්ජාල සේවාවට **පිවිසෙන්න (Login).** මෙම පියවර මගින් ඔබගේ **ගිණුම සක්‍රිය වනු ඇත.** දැන් ඔබට අන්තර්ජාලය හරහා ඔබගේ අයදුම්පත පිරවිය හැක. අයදුම්පත පිරවීම පියවර හතරකින් සමන්විතවේ. පියවර හතරම සම්පූර්ණ කිරීමට පෙර ඔබට ඕනෑම පියවරකදී අන්තර්ජාල සේවාවෙන් ඉවත්විය හැක අතර පසුව ඇතුලු වී ඔබ නැවැත්වූ ස්ථානයේ සිට නැවත අයදුම්පත සම්පූර්ණ කළ හැක.

4. පළමු පියවර ඔබගේ පෞද්ගලික විස්තර සම්බන්ධවයි. **පළමු පියවර සම්පූර්ණ කරන්න.**

5. දෙවන පියවර ඔබගේ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) හා අ.පො.ස.(උසස් පෙළ) ප්‍රතිඵල සම්බන්ධවයි. **දෙවන පියවර සම්පූර්ණ කරන්න.**

6. තුන්වන පියවරෙන් ඔබගේ පාසල් විස්තර අපේක්ෂා කෙරේ. **තුන් වන පියවර සම්පූර්ණ කරන්න.**

7. හතරවන පියවරෙන් ඔබ ඇතුලත් වීමට අපේක්ෂා කරන **අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙල** අපේක්ෂා කෙරේ.

8. ඔබ දැන් අයදුම්පත්‍රය පුරවා අවසානය. **සඳහන් කළ තොරතුරු සත්‍ය හා නිවැරදිදැයි නැවත ඉතා ඕනැකමින් කියවා තහවුරු කර ගන්න.**

9. දැන් ඔබගේ අන්තර්ජාල අයදුම්පත **යොමු කරන්න (submit).**

10. ඔබගේ අයදුම්පතෙහි **මුද්‍රිත පිටපතක් ලබා ගන්න.** එම මුද්‍රිත පිටපතෙහ ඔබ විසින් සම්පූර්ණ කරන ලද පියවර හතරට අමතරව පස්වන කොටස වශයෙන් අයදුම්කරුගේ ප්‍රකාශයද, හයවන කොටස වශයෙන් ඔබ පාසල් අයදුම්කරුවකු නම් පාසලේ විදුහල්පති විසින් සම්පූර්ණ කළ යුතු කොටසද, පෞද්ගලික අයදුම්කරුවකු නම් සාමදාන විනිශ්චයකරුවෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් සහතික කළ යුතු කොටසද දැක්වේ. මීට අමතරව Bar Code තීරු සහිත කොටසක් ද මුද්‍රණය වනු ඇත. මෙම Bar Code තීරු ලබා දී ඇත්තේ ඔබගේ අයදුම්පත සමග එවන ආධාරක ලියකියවිලිවල දෙපැත්තෙහිම කපා ඇලවීම සඳහාය.

11. **අධාරක ලියකියවිලිවල දකුණු පස ඉහළ කෙලවරෙහි පිටුව දෙපැත්තෙහිම අදාළ Bar Code තීරු කපා අලවන්න.** ප්‍රවේශ අත්පොතෙහි පිටු අංක 138 හි ඔබ විසින් අයදුම්පත සමග විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු ආධාරක ලියකියවිලිවල ලැයිස්තුවක් දක්වා ඇත.

12. මුද්‍රිත අයදුම්පතෙහි අයදුම්කරුගේ තොරතුරු සහ දිනය හොඳින් කියවා බලා **අයදුම්කරුගේ ප්‍රකාශය දැක්වෙන පස්වන කොටසේ අත්සන යොදන්න.**

13. **අත්සන් කරන ලද මුද්‍රිත අයදුම්පත අදාළ ආධාරක ලියකියවිලිද සමග ලියාපදිංචි තැපැලෙන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කරන්න.**

ලිපිනය: ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රවේශ,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
නො 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

**2015/2016 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉදිරියේදී අයදුම්පත් භාරගන්නා අවසාන දිනය ප්‍රකාශයට පත් කරනු ඇත.**

**වැදගත් සටහන්:**

- ඔබගේ අන්තර්ජාල අයදුම්පත්‍රය සලකා බලන්නේ අත්සන් යොදා සහතික කරන ලද මුද්‍රිත පිටපත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්වුව හොත් පමණි.
- **අයදුම්පත් භාර ගන්නා අවසන් දින සිට මසක් ඇතුළත** අයදුම්කරුවන් විසින් සඳහන් කරන ලද **"Uni-Code" හි කැමැත්තේ අනුපිළිවෙල** අන්තර්ජාලය හරහා හෝ අත්පොතෙහි ඒ සඳහා ලබා දී ඇති අයදුම්පත්‍රය භාවිත කොට **වෙනස් කිරීමට ඉඩ දෙනු ලැබේ.**
- ඔබ විශ්වවිද්‍යාලය සඳහා තේරී පත් වුව හොත් ඔබ තේරී පත්වූ **පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය** සඳහන් කරමින් **තේරීම් ලිපියක්** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඔබට එවනු ඇත. එවිට ඔබ තේරී පත්වූ එම පාඨමාලාව භාර ගන්නේ දැයි ඔබට තීරණය කළ හැකිය.
- එම පාඨමාලාව භාර ගැනීමට ඔබ තීරණය කරන්නේ නම්, **අන්තර්ජාලය භාවිත කරමින්** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා තේරී පත්වූ පාඨමාලාව සහ විශ්වවිද්‍යාල සඳහා ලියාපදිංචි විය යුතුය.

- පාඨමාලාව භාර නොගැනීමට ඔබ තීරණය කරන්නනේ නම්, එම පාඨමාලාව සහ විශ්වවිද්‍යාලය සඳහා ඔබ ලියාපදිංචි නොවිය යුතුය.

- නමුත් පුරප්පාඩු පිරවීම් යටතේ ඔබ විසින් අයදුම්පතෙහි ඉහළ කැමැත්තක් දක්වා ඇති පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා තවදුරටත් ඔබ තේරී පත්වීමට ඉඩ ඇත. මේ අවස්ථාවේදී ද එම පාඨමාලාව භාර ගන්නේ ද නැද්ද යන්න තීරණය කිරීමට ඔබට හැකියාව පවතී.

- කෙසේ නමුත්, ලියාපදිංචිය සඳහා ලබා දුන් අවසන් දින හෝ ඊට පෙර ලියාපදිංචි නොවුනහොත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඔබගේ ස්ථානය කුසලතා අනුපිළිවෙළ අනුව මීලඟට සිටින සිසුවාගෙන් පිරවීමට කටයුතු කරනු ලැබේ.

**2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් කැඳවීමේ නිල පුවත්පත් නිවේදනය, මෙම සතිය අවසානයේ පුවත්පත්හි පලකරනු ලැබේ.**

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2016.04.20